මොනරාගල පෞද්ගලික

# බස් වර්ජනයෙන් මඟීහු දැඩි අපහසුතාවක

ටෙන්ඩර් නොකැඳවා අත්තනෝමතිකව සිසුසැරියට බලපත්‍ර දීලා

මොනරාගල දිස්ත්‍රික් පෞද්ගලික බස් හිමියන්ගේ සංගමයේ සභාපති

දුන්නේ ටෙන්ඩර් මගින් විරෝධය නිසා තාවකාලිකව බලපත්‍ර අත්හිටුවූවා

ඌව පළාත් මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ සාමාන්‍යාධිකාරී ගවරත්න බණ්ඩාර

මොනරාගල දිස්ත්‍රික් මඟී ප්‍රවාහන පෞද්ගලික බස් රථ වැඩ වර්ජනයක නිරත වීම නිසා පාසල් යන ළමුන් ඇතුළු මඟී ජනතාව දැඩි දුෂ්කරතාවයන්ට පත්වූහ.

## <u>මෙම පුවත්පත් දැන්වීම හා බැඳේ</u>

පළාත් තුළ මාර්ගයක් සඳහා සිසු සැරිය සේවා ආරම්භ කරන ලෙස දෙමාපියන්ගෙ හෝ පාසැල් වලින් ලැබෙන ඉල්ලීම මත පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරී විසින් සිසුසැරිය සේවා බලපත්‍ර නිකුත් කරනු ලැබේ. එම බලපත්‍ර යටතේ ධාවනය වන බස්රථ, සිසු සැරිය ව්‍යාපෘතිය යටතේ ගිවිසුම් ගතවීම සඳහා අදාළ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ජාතික ගමනාගමන කොමිෂන් සභාවට යොමු කරනු ලබයි. එසේ යොමු කරන ලද බලපත්‍ර හිමියන් සමඟ ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ගිවිසුමක් අත්සන් කරනු ලබයි. එම් ගිවිසුම්ගත කොන්දේසිවලට අනුව ධාවනය වන සිසුසැරිය බස්රථ සඳහා මාසිකව සහනාධාර ගෙවීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි.

ඒ අනුව ඉහත පුවත් පත් දැන්වීමෙ සඳහන් ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ සිසුසැරිය බලපත්‍ර සම්බන්ධව බස්රථ හිමියන්ගේ විරෝධතාව සම්බන්ධයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.

අධ්‍යක්ෂ (සැලසුම්)
ජාතික ගමනාගමන කොමිෂන් සභාව